පදියතලාව ප්‍රාදේශීය සභාව

අම්පාර දිස්ත්‍රික්කය

-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 වැනි දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 03 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජනවාරි 06 දින සභාවේ සභාපතිවරයාට යවන ලදි.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පදියතලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුමකරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව නොවීම.

2014 ජනවාරි 27 දිනැති අංක පීඑල්/05/බීජ්/ශ්‍රීලරාඅගිප්‍ර දරන පලාත් පාලන සහ පලාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු.**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට කඩ කාමර තැන්පතු ලේඛණයේ ශේෂය රු.60,000 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.90,000 ක් ලෙස, එනම් රු.30,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගන්නා ලද යන්ත්‍ර සූත්‍රවල වටිනාකම රු.1,463,200 ක් වූ අතර එම අගය ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි.

(ඇ) ඉදිරිපත් වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කල අගය මත බදු මුදලේ ශේෂය රු.11,040 ක් වූවත්, එය රු.5,280 ක් ලෙස, එනම් රු.5,760 ක් අඩුවෙන් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ඈ) ඉදිරිපත් වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් බදු කොමසාරිස් වෙත ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.86,287 ක් වුවද, එය රු.79,996 ලෙස එනම් රු.6,291ක් අඩුවෙන් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ඉ) කඩ කුලී ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ කඩ කුලී ආදායම රු.508,775 ක් වූවද, මූල්‍ය ප්‍රකාශනවල රු.620,800 ක් ලෙස, එනම් රු.112,025 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) පොදු ගබඩා හා ඕවර්සියර්ගේ ක්ෂේත්‍ර ගබඩා ලෙස වර්ෂ ගණනාවක සිට රු. 114,240 ක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණද එම ගබඩාවල භෞතිකව එම තොගය නොපැවතුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි

1.3.3 **ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන සේවයේ වැන්දඹු අනත්දරු අරමුදලට වර්ෂ ගණනාවක සිට ගෙවිය යුතු රු. 367,245 ක දායක මුදල් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දේශීය ආදායම් බදු කොමසාරිස්ට වර්ෂ ගණනාවක සිට ගෙවිය යුතු එකතුකල අගය මත බදු රු. 11,040 ක් හා මුද්දර ගාස්තු රු. 80,287 ක් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.**

පහත සඳහන් ගිණුම් විෂයන් ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකළ බැවින් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂනය කිරීමට නොහැකි විය.

| **විෂයය** | **වටිනාකම** | **ඉදිරිපත් නොවූ සාක්ෂි** |
|---|---|---|
| | රු. | |
| කර්මාන්ත ණයහිමියෝ | 14,411,530 | කර්මාන්ත ණයහිමි ලේඛණය, ශේෂ සනාථ කිරීමේ ලිපි |
| කර්මාන්ත ණයගැතියෝ | 14,753,219 | කර්මාන්ත ණයගැති ලේඛණය, ශේෂ සනාථ කිරීමේ ලිපි |
| හිඟහිටි වෙනත් ආදායම් | 24,115 | ශේෂ සනාථ කිරීමේ ලිපි |

1.3.5 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරික්ෂණය විය.

| **නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| <u>**ප්‍රාදේශීය සභා රීති මාලාව**</u> | |
| රීති 59 - 66 | සභා ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත බදු අයකලයුතු කර්මාන්ත හඳුනාගැනීමට සහ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| රීති 153 | ආදායම් හිඟ මුදල් පිළිබඳ ප්‍රකාශනයක් පී.එස්.07 ආකෘති ප්‍රකාරව ප්‍රාදේශීය සභාව පවත්වා ගෙන යා යුතු වූවත් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| රීති 180 | මුදල්, ගබඩා හා ආදායම එකතු කිරීමේ කටයුතු භාරව ක්‍රියාකරන නිලධාරීන් විසින් ඉදිරිපත් කල යුතු ඇපකර ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.114,770 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් වූ අතර, එයට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.955,834 ක පුනරාවර්තන ආදායමක් ඉක්මවූ පුනරාවර්තන වියදමක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.841,064ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---:|---:|---:|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,000 | - | - |
| බදු කුලී | 3,619,600 | 1,325,076 | 250,070 |
| බලපත්‍ර ගාස්තු | 510,000 | 478,595 | - |
| සේවා සඳහා ගාස්තු | 670,000 | 583,968 | - |
| වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 783,000 | 1,074,071 | 202,059 |
| වෙනත් ආදායම් | 61,000 | 58,845 | 24,115 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

2013 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.131,600 ක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ද, උසාවි දඩ රු.70,499 ක් නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතුව තිබුනු අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 3.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයක් පැවැති බැවින්, අයවැය ලේඛනය සඵල කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණ බව නිරීක්ෂනය විය.

## 4. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන සම්බන්ධ අඩුපාඩු පිළිබඳ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) ණයගැති පාලනය

(ඇ) ලේඛණ පවත්වාගෙන යාම